පුවතක නිරවද්‍ය භාවය යනු මාධ්‍යකරණයේදී රැකිය යුතුම මාධ්‍ය ආචාර ධර්මයක් සහ ප්‍රතිපත්තියක් බව නොකිවමනායි. පුවත් සිරස්තලයක් ඔස්සේ හෝ පුවත් අන්තර්ගතය ඔස්සේ පාඨකයා නොමඟ නොයැවීමට වග බලා ගැනීමද එම නිරවද්‍ය භාවය යටතට පැමිණෙයි.

මෙරට පවතින ගුවන් ගමන් පාලකවරුන්ගේ හිඟය නිසා, මෙරට හරහා ගමන් කරන ජාත්‍යන්තර ගුවන් යානා සඳහා ලබාදෙන ගුවන් අවකාශ සේවා සැපයීම විදෙස් රටවල් කිහිපයකට හිමිවීමේ අවදානමක් පැන නැගී ඇතැයි දිවයින ඉරිදා සංග්‍රහය (ඔක්. 30, 2022) වාර්තා කරයි.

කෙසේ නමුත්, මෙම පුවත් වාර්තාව සඳහා දිවයින ඉරිදා සංග්‍රහය යොදාගෙන ඇත්තේ, "ශ්‍රී ලංකාවට ගුවන් අහසත් අහිමි වෙයි!" යන සිරස්තලයයි.

1) ගුවන් අවකාශ සේවා සැපයීම වෙනත් රටවල් කිහිපයකට හිමිවීමේ "අවදානමක්" පමණක් ඇති බව පුවත් වාර්තාවේ සඳහන් වන නමුත්, මේ වන විටත් ශ්‍රී ලංකාවට එය "අහිමි වී ඇති බවක්" සිරස්තලයෙන් ගම්‍ය නොවන්නේ ද?

2) එය පාඨකයා නොමඟ යවන සුළු සිරස්තලයක් නොවන්නේ ද?

3) මෙම සිරස්තලය ප්‍රශ්නාර්ථයක් සමගින්, "ශ්‍රී ලංකාවට ගුවන් අහසත් අහිමි වෙයි?" යනුවෙන් පළ වූයේ නම්, එය නිවැරදි නොවේද?

නොමඟ යවන සුළු සිරස්තල භාවිතා නොකරමු!
** අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ඔබගේ දුරකථනයටම ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා දැන්ම Ethics Eye subscriber කෙනෙක් වන්න!